356

RARE

# සිංහල වෙද ගැට පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

නායක බණ්ඩාරලාගේ පරාක්‍රම බලල්ල

කැලණිය විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව



| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 356 |
| වර්ග අංකය | |



2003 දෙසැ 04

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

# සාරසංග්‍රහය

"වෙදගැට" යනු සිංහල පද විශේෂයකි. මේවා සිංහල වෛද්‍ය ක්‍රමය හා සම්බන්ධය. හස්තසාර සිංහල වෙදකම් තම ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් පිට යා නොදී රැක ගැනීම පිණිම යෙදූ උපක්‍රමයක් ලෙස වෙදගැට නිර්මාණය විය. පරම්පරාගත සුවිශේෂ ඖෂධ වට්ටෝරු මෙම වෙදගැටවල අන්තර්ගතය. අභාවයට යමින් තිබූ මෙම වෙදගැට පිළිබඳ මෙතෙක් විධිමත් පර්යේෂණයක් සිදු වී නොමැත.

සිංහල වෛද්‍ය ක්‍රමයෙහි ස්වභාවය හඳුනාගැනීම සඳහා එහි ආවේනික ලක්ෂණ හඳුනාගත යුතුය. වෙදගැටවල අන්තර්ගත වී තිබූ එම ලක්ෂණ අපගේ පර්යේෂණයෙන් හෙළිකර ගත හැකි විය. මේ සඳහා " පැරණි වෙදගැට " ඉතා වැදගත්ය. මෙම පර්යේෂණයෙන් විනාශ මුඛයට යමින් තිබූ පැරණි වෙදගැට රාශියක් එක්රැස් වූවා මෙන් ම ඒවා සංරක්ෂණය ද කෙරිණි. එමගින් ම වෙදගැටවල සැඟ වී, වයෝවෘද්ධ වෛද්‍යවරුන් සමඟ ම වැළලී යන්නට තිබූ සිංහල වෛද්‍ය ක්‍රමයේ හස්තසාර වෙදකම් රාශියක් පිළිබඳ තොරතුරු මෙම පර්යේෂණයෙන් අනාවරනය වී තිබේ.

විවිධාකාර ලෙස නිර්මාණය කළ වෙදගැට මෙම පර්යේෂණය නිසා ඒකරාශිකර ගත හැකි විය. ඒවා තේරුම් ගැනීම දුෂ්කර කරුණක් ලෙස සලකා , සැකයෙන් යුතුව ඉවත දමා තිබිණි. වෙදගැටයක් ප්‍රයෝජනයට ගැනීම සඳහා ලිහා ගැනීමේ ක්‍රමෝපායයන් මෙම පර්යේෂණයෙන් අප එළි දක්වන ලදී. ඒ ඔස්සේ, හමුවන තවත් වෙදගැට තේරුම් ගත හැකිවනු ඇත.

වෙනත් විවිධ විෂයයන්ට මෙන් ම සිංහල වෙදකමට ද ඒ හා සම්බන්ධ ශබ්දකෝෂයක් ඇත. වෙදගැටවල අන්තර්ගතව තිබූ විවිධ වචන මෙම පර්යේෂණයෙන් එළි දැක්වීමට හැකි විය. ඒවා සිංහල වෛද්‍ය ක්‍රමය පිළිබඳව වූ ශබ්දකෝෂයේ පෝෂණයට ඉවහල් වේ.

වර්තමානයේ, වෙදගැට භාවිතයෙන් බැහැර වෙමින් තිබූ සාහිත්‍යාංගයක් ලෙස හඳුනාගත හැකි වීම නිසා ඒවා භාවිතය පිළිබඳ නව ප්‍රවේශයක් ලබා දීමට මෙම පර්යේෂණය හේතු වේ.

වෙදගැට ලිවීම සඳහා සිංහල භාෂා සාහිත්‍ය දැනුම ද කාව්‍යකරණය පිළිබඳ දැනුම ද අවශ්‍ය වෙයි. තේරවිලි කවි, දහම් ගැට ආදියේ ආභාසය ද වෙදගැට ලිවීම සඳහා උපයෝගී කර ගෙන ඇත. මෙම ඓතිහාසික පසුබිම පළමුවන පරිච්ඡේදයෙන් විස්තර කර තිබේ.

සිංහල තේරවිලි කවිවල ඡායා මාත්‍රයක් ද වෙදගැටවල තිබේ. උභය සාහිත්‍යාංගයන්හි ම සම අසමතාවෝ ද වෙති. එහි අන්තර්ගතය, ආකෘතිය හා පරමාර්ථ ආදී කරුණු දෙවන පරිච්ඡේදයෙහි දී පර්යේෂණයට ලක් කොට ඇත.

සිංහල භාෂකයකුට පවා නො වැටහෙන අන්දමින් සිංහල භාෂාව හසුරුවාගත් ආකාරය රහස් භාෂාවන්ගෙන් හෙළිවේ. මෙබඳු රහස් භාෂාවන්ගෙන් ලියැවුණු හස්තසාර සිංහල වෙදකම් ද තිබේ. මේවා පිළිබඳ අනාවරණය කර ගත් කරුණු තෙවන පරිච්ඡේදයට ඇතුළත් වන්නේ ය.

වෙනත් සිංහල පද්‍ය නිර්මාණ හා සසැඳීමේ දී වෙදගැට නම් වූ පද්‍ය විශේෂයෙහි සාහිත්‍යමය අගයක් තිබේදැයි යන්න පිළිබඳ කෙරෙන විමසුමක් සිව්වන පරිච්ඡේදයෙන් සිදු කෙරේ.

ජන ජීවිතය පිළිබඳ කාලීන තොරතුරු සාහිත්‍ය නිර්මාණ තුළින් පිළිබිඹු වේ. වෙදගැට ද සාහිත්‍ය අංගයක් වන බැවින් ගැමි පරිසරය, භාවිත භාණ්ඩ හා උපකරණ, සතුන්ගේ ජීවන රටා

හා වෘක්ෂලතා පිළිබඳ වූ කරුණු රාශියක් පස්වන පරිච්ඡේදයෙන් සාකච්ඡා කර ඇත.

වෙදගැට නම් වූ සාහිත්‍යාංගය හඳුනාගැනීම සඳහා එහි ලක්ෂණ විස්තර කර ඇත්තේ සවන පරිච්ඡේදයෙනි. එහි ගූඪ වචන නිර්මාණය කර ගත් ආකාරය, භාෂා ලක්ෂණ, රහස් බසින් බෙහෙත් වට්ටෝරු ප්‍රකශිත අන්දම, වෙදගැට - පැරණි හා නූතන වශයෙන් බෙදෙන අන්දම ආදී වැදගත් කරුණු රාශියක් මෙම පරිච්ඡේදයෙහි අන්තර්ගතය.

වර්තමානයේ වෙදගැට භාවිත වන්නේ ද? නැද්ද ? යන්න පිළිබඳවත්, වෙදගැට භාවිතයෙන් බැහැර වීමට තුඩු දී ඇති හේතු සාධකත් හත්වන පරිච්ඡේදයෙන් විස්තර වේ.

වෙදගැට විමර්ශනය නම් වූ අටවන පරිච්ඡේදය මෙම නිබන්ධයේ හරයයි. සර්ප විෂ හා සම්බන්ධ වූ වෙදගැට 92ක් ද, වෙනත් රෝග අවස්ථා සඳහා ලියැවුණු වෙදගැට 48ක් ද මෙයට ඇතුළත් ය. සර්ප විෂ සම්බන්ධ වූ වෙදගැට නැවත විවිධ සර්ප වර්ග අනුව ද වෙනත් රෝග අවස්ථා සඳහා වූ වෙදගැට ඒ ඒ රෝග නාම යටතේ ද විමර්ශනය කර තිබේ. විමර්ශනය අවසානයේ ඇති වගුවෙන් වෙදගැට සැපයූ වෛද්‍යවරුන් පිළිබඳ සම්පිණ්ඩනයක් ද ඉදිරිපත් කෙරේ.

වෙදගැට පිළිබඳ ව අප විසින් කරන ලද ශාස්ත්‍රීය පර්යේෂණයෙන් සපයාගත් නිගමනයන් ද මෙහි අන්තර්ගත කර ඇත. තව ද මෙහි වූ උපග්‍රන්ථයෙහි අනුපිළිවෙළින් වෙදගැටය - ගැට ලිහුම හා අර්ථය ද, වෙදගැට සැපයූ පුද්ගල නාමාවලිය ද, වෙදගැටවල සඳහන් ගූඪ වචන සඳහා සකස් කළ සූචිය ද ඇතුළත් කර තිබේ.

---